www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ යෝධ සමාගම පරිසරවේදියාට නඩු පවරයි

## Sri Lankan corporate giant sues environmental activist

විලානි පීරිස් විසිනි
2015 දෙසැම්බර් 14

රටේ විශාලතම එක් ව්‍යාපාර සමූහයක්, සමාගම අපකීර්තියට පත් කිරීමේ චෝදනාව යටතේ රුපියල් මිලියන 250ක (ඩොලර් මිලියන 1.75) වන්දියක් ඉල්ලා පරිසරවේදියෙකුට විරුද්ධව නඩු පවරා ඇත.

හේලීස් ව්‍යාපාර සමූහයට අයත් සීමාසහිත ඩිප්ඩ් ප්‍රඩක්ට්ස් (ඩීපීඑල්), තමන්ට අයත් හංවැල්ල රබර් නිෂ්පාදන කම්හල වායු හා ජල දූෂනයට වගකිව යුතු බවට චෝදනා කරමින් නෙත් එෆ්එම් ගුවන්විදුලි සේවයට සම්මුඛ සාකච්ඡාවක් දී ඇතැයි, කැලනි ගංගා නිම්න ආරක්ෂක සංවිධානයේ සභාපති පද්මසිරි වීරසිංහට එරෙහිව චෝදනා නගා ඇත. කම්හල පිහිටා ඇත්තේ කොලඹ සිට කිලෝ මීටර් 30ක් දුරින්, තුන්නාන ප්‍රදේශයේය.

මැයි 10දා දුන් සම්මුඛ සාකච්ඡාවෙන් වීරසිංහ, තම "ප්‍රතිරූපයට හා කීර්තියට" හානි කර ඇති බව ඩීපීඑල් කියයි. දෙසැම්බර් 16දා නඩුව විභාග කිරීමට නියමිතය.

අප්‍රේල් 30 දින මහේස්ත්‍රාත්වරයා දුන් තීන්දුව මත පදනම්ව තම සාකච්ඡාව ගෙන ගිය බව වීරසිංහ කියයි. කම්හල නිසා "ලිං හා ජල ව්‍යාපෘතිය මගින් සපයන ජලය බීමට සුදුසු නැති, කෘෂිකාර්මික කටයුතු කල නො හැකි තරම් මහජන අපහසුතා හටගෙන ඇත. කම්හල පිහිටා ඇති ප්‍රදේශයේ ජීවත්වන ජනතාව නොයෙකුත් ස්වසන ආබාධ සහ අක්මා, ආමාශ හා සම්බන්ධ ලෙඩ රෝගවලින් සහ දෛනික වැඩකටයුතු අඩාල කරන ශබ්දවලින් පීඩා විඳිති."

මහේස්ත්‍රාත්වරයා සති දෙකක් ඇතුලත කම්හල වසා දැමීමට නියෝග කලේ ය. කෙසේ නමුත්, ඩීපීඑල් අවිස්සාවේල්ල මහාධිකරනයට අභියාචනා කල අතර, එහි දී විනිශ්චයකාර දේවිකා අබේරත්න මිය නොවැම්බර් 11වැනිදා නියෝගය වෙනස් කලා ය. මහේස්ත්‍රාත්වරයා නො මග යවා ඇතැ යි ද පාරිසරික අධිකාරිය වැනි "රජයේ ආයතන විසින් ඉදිරිපත් කරන ලද ලියවිලි" උසාවිය දැන් සලකාබලා ඇති බව ද ඇය පැවසූවා ය. ඒ අනුව කම්හල පරිසර දූෂන ඇති නො කර යි.

ප්‍රදේශයේ ජනතාවගේ සහයෝගය ඇතිව ඩීපීඑල් චෝදනාවලට අභියෝග කිරීමට තමා කැමති බව වීරසිංහ *ලෝක සමාජවාදී වෙබ් අඩවියට* පැවසී ය. "මම කම්හල අපකීර්තියට පත් කලේ නෑ. මම එහි ව්‍යාපාර කටයුතුවලට බාධා කලේ නෑ. මම කලේ ප්‍රදේශයේ මහජනයා මුහුන දෙන අනාරක්ෂිත තත්වය පැහැදිලි කිරීම යි" ඔහු පැවසී ය.

තමා ජනාධිපති මෛත්‍රීපාල සිරිසේනගේ හා රනිල් වික්‍රමසිංහගේ ආන්ඩුව විශ්වාස කල නමුත් එය ජනතාවගේ ප්‍රශ්න විසඳන්නේ නැති බව ඔහු පැවසී ය.

සැකයට භාජනය වුනු හංවැල්ල රබර් නිෂ්පාදන කම්හලේ දූෂනය ගැන අධිකාරීන්ට පැමිනිලි කරමින් තුන්නාන ගම්වැසියෝ වසර ගනනාවක් විරෝධතා සංවිධානය කලහ. 2014 මාර්තු මාසයේ දී සිය ගනනක් පෙලපාලි ගිය අවස්ථාවේ දී පුද්ගලයන් ගනනවාකට තුවාල සිදු කරමින් හා 60දෙනෙකු අත්අඩංගුවට ගනිමින් පොලීසිය ම්ලේච්ඡ ප්‍රහාරයක් මුදා හලේ ය.

මෙය කාර්මික දූෂනයට එරෙහි මහජන විරුද්ධත්වය මර්දනය කිරීමේ ආන්ඩුවේ වාර්තාවේ තවත් කොටසකි. 2013 අගෝස්තුවේ දී, ජනාධිපති මහින්ද රාජපක්ෂගේ ආන්ඩුව කොලඹට ආසන්න රතුපස්වල ඩීපීඑල් සමාගමේ වෙනිග්‍රොස් කම්හලට එරෙහිව විරෝධතාව මැඩීමට හමුදාව බලමුළු ගැන්වූයේ ය. කම්හලේ අපද්‍රව්‍ය ප්‍රදේශයේ භූගත ජලය අපවිත්‍ර කරන බවට චෝදනා කල ගම්වැසියෝ කම්හල ප්‍රදේශයෙන් ඉවත් කිරීමට උද්ඝෝෂනය කලහ. හමුදා ප්‍රහාරයේ දී තරුනයන් තිදෙනෙක් ඝාතනය කරන ලද අතර 40දෙනෙක් තුවාල ලැබූහ.

ඩීපීඑල් සමාගම පසුව අකමැත්තෙන් වෙනිග්‍රොස් කම්හල බියගම කාර්මික කලාපයට මාරු කලේ ය. බොහෝ ස්ථිර හා කොන්ත්‍රාත් කම්කරුවෝ නෙරපන ලද අතර අඩු වැටුප් හා අයහපත් කොන්දේසි යටතේ අලුතින්

කම්කරුවෝ බඳවා ගන්නා ලදී.

වැලිවේරිය හා තුන්නාන ජනතාව තවමත් පාරිසරික ගැටළුවලට මුහුන දෙමින් ද හමුදා හා පොලිස් ප්‍රහාරයන්ගෙන් මියගිය හා තුවාල ලත් ඥාතීන් වෙනුවෙන් පීඩා විඳිමින් ද සිටින අතර ඩීපීඑල් පසු ගිය වසරේ දී එහි ඉහලම ලාභය වාර්තා කලේ ය.

රාජපක්ෂ ආන්ඩුව මෙන් ම සිරිසේන ආන්ඩුව ද රතුපස්වල හෝ තුන්නාන දූෂනය ගැන නිසි විභාගයක් කර නොමැත. රතුපස්වල හමුදා ප්‍රචන්ඩත්වයට හා තුන්නාන පොලිස් ප්‍රහාරයට වගකිවයුත්තෝ නිදහසේ සිටිති.

ඩීපීඑල් නඩුවට පුළුල් ගම්‍යයන් පවතී. ලාභ ශ්‍රමය හා ඉහල ලාභ සඳහා දුවන මහා සමාගම්වලට අවශ්‍ය වන්නේ, ශ්‍රී ලංකාව තුල බහුලව පැතිරුනු කාර්මික දූෂනයන්ට එරෙහිව කම්කරු පීඩිත ජනතාවගේ විරුද්ධත්වය නිහඬ කිරීමට ය.

කොලඹට ආසන්නයේ, කැලනි ගඟට යාබදව පිහිටි කොකාකෝලා කම්හලින් කාන්දුවුනු තෙල් කැලනි ගඟ දූෂනය කල අතර බීමට ගන්නා ජල පිරිපහදු පොම්පාගාරයකට බල පෑ බව අගෝස්තු මාසයේ දී හෙලිදරව් වුනි. කොලඹ ඇතැම් ප්‍රදේශවල හා ඒ අවට දින දෙකක් පුරා ජල සැපයුම අත්හිටවීමට ජල සම්පාදන මන්ඩලයට සිදුවිය. පසුව ජල සම්පාදන මන්ඩලයට වන්දි ගෙවීමෙන් සමාගමට නීතිමය වගකීමෙන් නිදහස් විය හැකි විය.

සොබාදහම සුරැකීමේ ජාත්‍යන්තර සංගමයේ ශ්‍රී ලංකා නියෝජිත ආචාර්ය ආනන්ද මල්වතන්ත්‍රි සන්ඩේ ටයිම්ස් පත්‍රයට පැවසුවේ, ලොකු කුඩා කම්හල් 6,000ක් පමන කැලනි ගඟ දෙපස පමනක් පිහිටා ඇති බව යි. ඔහුගේ සංවිධානය දූෂනය නතර කිරීමට උපාය මාර්ග සැලසුම් කරමින් සිටින බව ඔහු පැසුවේ ය.

මල්වතන්ත්‍රිගේ තොරතුරු හෙලිදරව් කරන්නේ, පුළුල්ව පැතුරුනු පරිසර දූෂනයට සම්බන්ධ ගැටළු ය. කෙසේ නමුත්, සිරිසේන/වික්‍රමසිංහ ආන්ඩුව, විදේශීය හා දේශීය සමාගම් වෙනුවෙන් තව තවත් ආයෝජන කලාප ඇති කරන බවට පොරොන්දු දී ඇත. මෙයින් සිදුවනු ඇත්තේ පාරිසරික හානිය උත්සන්න වීම පමනී.

2013 නොවැම්බරයේ දී, වැලිවේරිය ජල දූෂනය සම්බන්ධයෙන් සසප ස්වාධීන කම්කරු පරීක්ෂන කමිටුවක් දියත් කලේ ය. පසුව එම පරීක්ෂනය, තුන්නානේ වායු හා ජල දූෂනය පිලිබඳ පැමිනිලි විභාග කිරීම දක්වා දීර්ග කලේ ය.

මෙම පරීක්ෂනය අතරතුර කම්හල් විසින් මුදාහරින ලද ජලය සමග මුසු වූ විස රසායනික, ජලය දූෂනය වීමට හේතු වී ඇති බවට සාක්ෂි ඉදිරිපත් විය. සමාගම් හා පරිසර අධිකාරිය ඇතුළුව විවිධ රජයේ ආයතන සත්‍යය වසං කර ඇත්තේ කෙසේ දැ යි මෙම පරීක්ෂනය හෙලිදරව් කලේ ය.

පරීක්ෂන කමිටුව නිගමනය කලේ, අවශ්‍ය පියවර ගැනීමට ආන්ඩුවට බල කිරීමට උත්සාහ දැරීමෙන් ධනේශ්වර ලාභ පද්ධතිය විසින් නිර්මානය කරනු ලබන පාරසරික ව්‍යසන වැලක්විය නො හැකි බව යි.

"ධනපති ක්‍රමයට මහජනයාගේ මූලික අවශ්‍යතාවන් සැපයිය නො හැකි" බව කමිටුව පැහැදිලි කලේ ය. "ඒ වෙනුවට ඔවුන් උත්සාහ ගන්නේ, පසු ගිය සියවසේ දී කම්කරු පන්තිය විසින් දිනා ගන්නා ලද අයිතීන් විනාස කිරීමට ය. සෑම රටකම සමාජ ප්‍රතිවිප්ලවය දියත් කෙරී ඇත්තේ කම්කරු පන්තියට එරෙහිව ය. කාර්මික දූෂනය හා අනෙකුත් විනාසකාරී තත්වයන් අවසාන කල හැක්කේ, පොහොසතුන්ගේ ධනය සඳහා නො ව මනුෂ්‍ය වර්ගයාගේ අවශ්‍යතාවන් ඉටු කිරීම පිනිස තර්කාන්විතව සංවිධාන කෙරුනු සමාජවාදී පද්ධතියක් හා නිෂ්පාදනයක් ස්ථාපිත කිරීම හරහා පමනි."

වීරසිංහට එරෙහි නඩුව කම්කරු පන්තියට අනතුරු ඇඟවීමකි. මහා ව්‍යාපාරිකයින්ට වඩ වඩා සහන පූජා කරමින් විදේශ ආයෝජන ඇද ගැනීමට ද ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් තවත් ඇපකර නයක් ලබා ගැනීමට සූදානම්වීමට හා වඩ වඩා කප්පාදු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට ද සිරිසේන - වික්‍රමසිංහ උත්සාහ කරන තත්වය යටතේ, මෙය කම්කරු පන්තිය හා දුගීන් මත එල්ල කෙරෙන පුළුල් ප්‍රහාරයක කොටසකි.

කතුවරිය පහත සඳහන් ලිපිය ද කියවන ලෙස ඉල්ලා සිටියි:

*ශ්‍රී ලංකාව: ස්වාධීන කම්කරු පරීක්ෂන කමිටුව වැලිවේරිය ජල දූෂනය පිලිබඳ වාර්තා හා නිගමන ඉදිරිපත් කරයි*

(2014 ජූලි 24)

© www.wsws.org